මගේ අංකය / எனது இல. / My No. — චක්‍රලේඛ අංක: 10/2013

ඔබේ අංකය / உமது இல. / Your No. — RG/MBD/1/2012

දුරකථන අංක / தொலைபேசி இல. / Telephone Nos. — 2889488, 2889489

ෆැක්ස් අංකය / தொலைநகல் / Fax No. — 2889491

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — info@rgd.gov.lk, rg@rgd.gov.lk

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව
பதிவாளர் நாயகத் திணைக்களம்
REGISTRAR-GENERAL'S DEPARTMENT

ප්‍රධාන කාර්යාලය
தலைமை அலுவலகம்
HEAD OFFICE

වෙබ් අඩවිය / இணையத்தளம் / Web site — www.rgd.gov.lk

තැ. පෙ. අංකය / த. பெ. இல. / P. O. Box No. — 565

234/A3,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

234/A3,
டென்சில் கொப்பேகடுவ மாவத்தை,
பத்தரமுல்லை.

234/A3,
Denzil Kobbakaduwa Mawatha,
Battaramulla.


දිනය / திகதி / Date: 2013/10/

සියළුම මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර්වරුන් සහ

සියළුම සාමාන්‍ය/ උඩරට විවාහ රෙජිස්ට්‍රාර්වරුන් වෙත,

## <u>මුස්ලිම් භක්තිකයන්ගේ විවාහ ලියාපදිංචි කිරීම</u>

ශ්‍රී ලංකාවේ වෙසෙන මුස්ලිම් භක්තිකයන්ගේ විවාහ ලියාපදිංචි කිරීම සඳහා මුස්ලිම් විවාහ පනත අදාල වේ. මෙම පනත යටතේ විවාහ ලියාපදිංචි කල හැකි වන්නේ ශ්‍රී ලංකාවේ පදිංචි මුස්ලිම් භක්තිකයන්ට පමණක් වන අතර, පාර්ශ්වකරුවන් දෙදෙනාම ඉස්ලාම් භක්තිකයන් වීමද අනිවාර්ය අවශ්‍යතාවයකි.

02. මුස්ලිම් විවාහ පනත යටතේ විදේශික ඉස්ලාම්වරුන්ගේ විවාහ ලියාපදිංචි කිරීමට කිසිදු ප්‍රතිපාදනයක් සලසා නොමැත. එබැවින් විදේශික ඉස්ලාම්වරුන්ගේ විවාහ මෙම පනත යටතේ ලියාපදිංචි කිරීමෙන් සම්පූර්ණයෙන් වැලකී සිටිය යුතුය.

03. තවද දෙපාර්ශ්වයම ඉස්ලාම් භක්තිකයන් වන අවස්ථාවලදී එම පුද්ගලයන්ගේ විවාහ සාමාන්‍ය විවාහ පනත යටතේ හෝ උඩරට විවාහ පනත යටතේ ලියාපදිංචි නොකල යුතුය. විවාහ පාර්ශ්වකරුවන්ගෙන් එක් පාර්ශ්වයක් පමණක් ඉස්ලාම් වන අවස්ථාවකදී සාමාන්‍ය විවාහ පනත යටතේ පමණක් විවාහ ලියාපදිංචි කිරීමට හැකි බවද කාරුණිකව දන්වමි.

04. විවාහ ලියාපදිංචි කිරීමේදී මෙම කරුණු පිළිබඳව දැඩි අවධානයෙන් කටයුතු කරන ලෙස වැඩිදුරටත් කාරුණිකව දන්වමි.

රෙජිස්ට්‍රාර් ජනරාල්

ඩී. එම්. ගුණසේකර
රෙජිස්ට්‍රාර් ජනරාල්

පිටපත: සියළුම දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරුන් - නිරන්තර අධීක්ෂණයට සහ අ.ක.ස.